## 07 ශ්‍රේණිය

# නර්තනය

## වන්නම් ගායනය



අන්තර්ගතය - වී.ඒ.කේ.පී.සංජීවනී - බප/කැල/සාන්ත ෆ්‍රැන්සිස් ම.වි., කැලණිය
සැකසුම - ජී. ඒ. ඩී. තාරකා - මාර/මහින්ද රාජපක්ෂ විද්‍යාලය , මාතර

Learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

# වන්නම්

- උඩරට **වන්නම් 18 ක්** ඇත.
- වන්නම් නිර්මාණය වී ඇත්තේ **මහනුවර යුගයේය.**
- නෘත්‍ය මණ්ඩලය සඳහා වන්නම් රචනා කොට ඇතැයි සැලකෙන්නේ **රම්මොලවක අධිකාරම්** විසිනි.

උඩරට වන්නම් 18 න් 7 ශ්‍රේණිය සඳහා ගායනා කිරීමට නියමිතව ඇත්තේ තුරඟා වන්නමය.



# තුරඟා වන්නම

- තුරඟා වන්නමෙන් කියවෙන්නේ **බෝසතාණන් වහන්සේ ගිහිගෙයින් නික්ම යෑමේ සිද්ධීන්ය**.
- ඡන්න ඇමති හා කන්ථක අසු සමඟ ගිහිගෙය හැරයාම විස්තර කර ඇත.
- වන්නම් යන්නෙහි අර්ථයද **වර්ණනාව** යන්නයි.
- මෙම වන්නමේ වර්ණනා කර ඇත්තේ **අභිනිෂ්ක්‍රමණයයි.**



- තුරඟා වන්නම **මාත්‍රා 2 + 3** දෙතිතට අයත්ය.
- එනම් **සුළු මැදුම් දෙතිතට** අයත්ය.
- තුරඟකුගේ ගමන් විලාශය දැක්වෙන තාලයකින් යුත් මෙම වන්නම ගායනයේදී නිවැරදිව තාල තබමින් ගායනා කිරීම වැදගත් වේ.

7 ශ්‍රේණියේදී ගායනා කල යුතු තුරඟා වන්නම පහත සඳහන් වේ



# තුරඟා වන්නම් ගායනය

- තාලය : මාත්‍රා 2 + 3 දෙතිත

  සුළු මැදුම් දෙතිත

- බෙර පදය : දොං ජිංත ගත දොංත



සත් වෙත් මහත් අදර - ලත් යුත් සිදත් කුමරු
ගත් සිත් තොසත් පැවිදි අංගා
අණ කරන ඡන්නයෙන - කන්ථකය අසු ගෙනෙන
ගෙන එදුන අසුගෙ පිට නැංගා

ගත් ගත් පයත් අසුගෙ - ශබ්දත් වසත් සුරිඳු
යන්නෙන් තොසින් තිදෙන සමඟා
යන යනෙන කල තිදෙන - එතැන තැන පසුව දැන
ගං තෙරට පත් වුණිය එමඟා



ලත් ලත් සිතත් තිදෙන - වෙත් වෙත් එකත් පසුව
මුත් කන්ථකත් වේය තුරඟා
සිදුහතුන් ගෙන වහන - ඡන්න වල්ගය අතින
පැන්නෙන් එතෙර අනොම ගංඟා

ගොත් සිත් මහත් රුසිරු - ලත් යුත් සිදත් කුමරු

ගෙන් සත් රැගත් නෙරත අංඟා
තිදෙන පැන ගියෙ ගඟින - එතෙද අණ ගෙන බැතින
යෙදුව නැණ වර්ණයෙන තුරඟා

- කස්තිරම : කුඳ ගජිත /// කුඳ තා //

  කුඳ ගජිත කුඳ තා //

  කුඳ තා //

  කුඳ ගජිත /// කුඳ තා



- සීරු මාරුව : කුඳ ගජිජි ගත දොංත - ගජ්ජිං ගජිං ජිගත

  කුඳ ගජිජි ගත දොංත දොංතා

- අඩව්ව : තත් තකට තක රොං

  තක්කඩ තක්කඩ කුඳ තක රොං

  තකරොං ගජිං ජිගත

  කිටි තකට කුංඳත් ජික රොං





# තුරඟා වන්නම නර්තනය

- ගයන ලද වන්නමේ තාලයට අදාළව සාම්ප්‍රදායික පද නර්තනය කොට වන්නම සම්පූර්ණ කල හැකිය.

- තිතට අදාළව පද නිර්මාණය කළ යුතුය.

- වන්නම නැටීමේදී මූලිකවම තානම ගයා, තානමට පද නැටීම සිදුවේ.

- ඉන්පසුව වන්නම නටා අවසානයේ කස්තිරම හා සීරුමාරුව නැටීමෙන් අනතුරුව අඩව්ව නැමැති සංකීර්ණ පද කොටස නටා වන්නම අවසන් කරයි.

- වන්නම නැටීමේදී අදාළ තිතට නැටිය යුතු අතර නිවැරදි අංගහාර පවත්වා ගත යුතුය.